# මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
## நிதி, பொருளாதார அபிவிருத்தி, கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
## MINISTRY OF FINANCE, ECONOMIC DEVELOPMENT, POLICY FORMULATION, PLANNING AND TOURISM

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/25/2024
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.09. 30

**අයවැය චක්‍රලේඛ අංක: 03/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**අංක 2403/53 දරන 2024.09.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව විෂයයන් බෙදා වෙන් කරන ලද නව අමාත්‍යාංශවල ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා 2023 අංක 34 දරන විසර්ජන පනත මගින් 2024 වර්ෂය සඳහා සම්මත වී ඇති ප්‍රතිපාදන යොදා ගන්නා ආකාරය**

**01. අයවැය ප්‍රතිපාදන**

**01.1 සැපයුම් හා සේවා වියදම්**

2024.09.27 දිනැති අංක 2403/ 53 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඊට පූර්වයෙන් පැවති අමාත්‍යාංශ 29ක් යටතේ වෙන් කර තිබූ විෂයයන් හා කාර්යයන් නව අමාත්‍යාංශ 15ක් යටතට වෙන්කර ඇත. 2024 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කර ඇති 2023 අංක 34 දරන විසර්ජන පනතේ වෙනස්වීමක් මේ අවස්ථාවේදී සිදු නොවන බැවින් තවදුරටත් උක්ත පනතේ සඳහන් වැය විෂයන් යටතේම 2024 වර්ෂය අවසන් වන තුරු වැය දැරීමට සිදුවනු ඇත.

ඒ අනුව, නව අමාත්‍යාංශවල ඉදිරි කටයුතු පවත්වාගෙන යාමේදී මේ සමඟ අමුණා ඇති උපලේඛන 01හි 02 තීරුවේ දක්වා ඇති වැය විෂය විස්තර යටතේ මේ වන විට ඉතිරිව පවතින ප්‍රතිපාදන උපයෝගී කරගත යුතු ය. යම් අමාත්‍යාංශයක් තවත් එක් අමාත්‍යාංශයකට අනුයුක්ත කර ඇති විට පෙර පැවති වැය ශීර්ෂය එලෙසින්ම භාවිත කළ හැකිය. යම් අමාත්‍යාංශයක් නව අමාත්‍යාංශ දෙකකට හෝ ඊට වැඩි ගණනකට බෙදී යන අවස්ථාවලදී විෂයයන් බෙදීමට අනුරූප වන ලෙස ව්‍යාපෘති / උප ව්‍යාපෘති හඳුනාගැනීමෙන් අනතුරුව අයවැය ප්‍රතිපාදන නව අමාත්‍යාංශ අතර බෙදා වෙන් කර ඇත. ඉදිරි වියදම් සඳහා බැඳීම් ඇති කර ගැනීමේ දී මෙම චක්‍රලේඛය නිකුත් කරන දිනට ඒ ඒ වැය විෂය විස්තරය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයෙන් මේ දක්වා දරා ඇති වියදම් සහ බැඳීම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අඩු කළ පසුව ඉතිරිවන ප්‍රතිපාදන ප්‍රමාණය පදනම් කරගත යුතු ය.

එක් අමාත්‍යාංශයක් යටතට අමාත්‍යවරයාගේ වියදම් සඳහා ප්‍රතිපාදන සලසන 1-01 ව්‍යාපෘති කිහිපයක් වෙන් කර ඇති විට තෝරාගත් එක් ව්‍යාපෘතියක් පමණක් ඉදිරි කාලය තුළ සක්‍රියව පවත්වා ගනිමින් අනෙකුත් ව්‍යාපෘති යටතේ නව බැඳීම් ඇති කර නොගැනීමට වගබලා ගත යුතු ය. එසේම, එම ව්‍යාපෘතිවල ඉතිරි ප්‍රතිපාදන වෙනත් කටයුතු සඳහා මාරු කිරීමට කටයුතු නොකළ යුතුය.

දෙපාර්තමේන්තු සහ පළාත් සභා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වැය ශීර්ෂ අතර බෙදී නොයන බැවින්, එම වැය ශීර්ෂ ඒ ආකාරයටම තව දුරටත් භාවිත කළ හැක.

**01.2. අත්තිකාරම් ගිණුම් කටයුතු**

2023 අංක 34 දරන විසර්ජන පනත මගින් අනුමත කරන ලද අත්තිකාරම් ගිණුම් නව අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීම මේ සමඟ අමුණා ඇති උපලේඛන 02හි සඳහන් පරිදි විය යුතු ය. 2024 වර්ෂයේ ඉදිරි කාලය

සඳහා කාර්ය මණ්ඩලය සඳහා ණය අත්තිකාරම් ලබා දීමේ දී නව අමාත්‍යාංශ ඇති කිරීමට පූර්වයෙන් ඒ ඒ නිලධාරියා අනුයුක්තව සිටි වැය ශීර්ෂයට අදාළ අත්තිකාරම් ගිණුම් විෂය අංකය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන තවදුරටත් යොදාගත යුතු ය.

**02. අක්මුදල් නිදහස් කිරීම**

2023 අංක 34 දරන විසර්ජන පනත මගින් 2024 වර්ෂය සඳහා සම්මත වී ඇති වැය ශීර්ෂ මත ඉදිරියටත් අක්මුදල් නිදහස් කිරීම සිදු කරනු ලබන බැවින් දැනට ක්‍රියාත්මක අග්‍රිම ගිණුම් අංක තවදුරටත් එලෙසම පවත්වා ගෙනයා යුතු ය. එහිදී අංක 01 උපලේඛනය අනුව ප්‍රතිපාදන පවරා දී ඇති නව අමාත්‍යාංශ ලේකම් මඟින් අවශ්‍ය අක්මුදල් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වන අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පූර්වයෙන් අක්මුදල් නිදහස් කරන ලද අග්‍රිම ගිණුම යටතේ වූ නිල බැංකු ගිණුම වෙතම අක්මුදල් නිදහස් කරනු ඇත.

**03. ගිණුම් තැබීම**

**03.1 සැපයුම් හා සේවා වියදම් ගිණුම් තැබීම**

ඇතැම් අමාත්‍යාංශ අහෝසි වී එහි සියලු කාර්යයන් වෙනත් එක් අමාත්‍යාංශයකට හෝ අමාත්‍යාංශ කිහිපයකට එකතු වුව ද, 2023 අංක 34 දරන විසර්ජන පනත තවදුරටත් බලාත්මක බැවින් හා පෙර පැවති අමාත්‍යාංශවලට අදාළ වැය ශීර්ෂ හා ඊට අදාළ අනුමත අග්‍රිම ගිණුම් තව දුරටත් එලෙසම ක්‍රියාත්මක වන බැවින්, 2024 වර්ෂයේ ඉදිරි කාලය තුළ වියදම් දැරීම සහ අදාළ ගිණුම් තැබීම් මේ දක්වා සිදු කළ ආකාරයටම පවත්වා ගෙන යා යුතු ය.

**03.2 අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ගිණුම් තැබීම**

අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ගිණුම් තැබීම ද 2023 අංක 34 දරන විසර්ජන පනතේ සඳහන් වූ අත්තිකාරම් ගිණුම් වැය විෂය අංක යටතේම තව දුරටත් සිදු කළ යුතු ය. ඒ අනුව, යම් අමාත්‍යාංශයක් යටතට අත්තිකාරම් ගිණුම් කිහිපයක් පැවරී ඇති විට ඒ ඒ අත්තිකාරම් ගිණුම සඳහා වෙන වෙනම ගිණුම්කරණ කටයුතු පවත්වාගෙන යා යුතු ය.

**03.3 තැන්පතු හා වත්කම් ගිණුම්**

යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි සියලු කාර්යයන් වෙනත් එක් අමාත්‍යාංශයකට පමණක් එකතු වන විට නව අමාත්‍යාංශය විසින් අහෝසි වන අමාත්‍යාංශයට අදාළ තැන්පතු හා වත්කම් ගිණුම් පැරණි ගිණුම් අංක යටතේම සිදු කළ යුතු ය.

යම් අමාත්‍යාංශයක් අහෝසි වී එහි කාර්යයන් වෙනත් අමාත්‍යාංශ කිහිපයකට පැවරී ඇති අවස්ථාවලදී අහෝසි වූ අමාත්‍යාංශයේ කාර්යයන්ගෙන් වැඩි ප්‍රමාණයක් පැවරුණ නව අමාත්‍යාංශය විසින් අහෝසි වන අමාත්‍යාංශයට අදාළ තැන්පතු හා වත්කම් ගිණුම් පැවති අංක යටතේම පවත්වාගෙන යා යුතු ය.

**03.4 වාර්ෂික ගිණුම් ප්‍රකාශන**

2024 වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ උපදෙස් භාණ්ඩාගාරය විසින් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

**04. කාර්ය මණ්ඩලය**

නව අමාත්‍යාංශ ව්‍යුහයට අනුව කාර්ය මණ්ඩලය බෙදා වෙන් කිරීමක් මේ අවස්ථාවේදී සිදු කිරීම ප්‍රායෝගිකව අසීරු බැවින් අමාත්‍යාංශ අතර කාර්යයන් බෙදී යන ආකාරයට අනුකූල වන පරිදි කාර්ය මණ්ඩලය නව අමාත්‍යාංශවල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු ය.

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම්.අනෝමා නන්දනී මහත්මිය (දු.අං.0112-484681) විමසා ලබා ගත හැකි ය.

**කේ.එම්. මහින්ද සිරිවර්ධන**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් : (i). ජනාධිපති ලේකම්
(ii). අග්‍රාමාත්‍ය ලේකම්
(iii). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv). විගණකාධිපති